INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: යුද අපරාධ චූදිතයන්ට උසස්වීම් නොදී නඩු පවරනු**

2017 මැයි 26

**ජොහැන්නස්බර්ග්:** චූදිත යුද අපරාධ කරුවන්ට උසස්වීම් ලබා නොදී ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන විසින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීමේ කටයුතු ආරම්භ කළ යුතු බව අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලබන්නවුන් පිළිබඳ තොරතුරු ගොනු වලින් පළමු වැන්න ප්‍රසිද්ධියට පත් කරන සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) පවසයි. යුද්ධයේ අවසාන භාගයේ 2008-9 දී සාමාන්‍ය වැසියන්ට සහ රෝහල්වලට පහර දීම පිළිබඳව, හිටපු යුද හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානී ජගත් ඩයස්, ITJP ලියැවිල්ල විසින් වරදකරුවකු බවට පත් කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ ශ්‍රී ලංකා භට පිරිස් වලට චෝදනා එල්ලවන ස්ත්‍රී දූෂණයක් සම්බන්ධයෙන් විභාග කිරීම භාරව සිටි ජගත් ඩයස් පැමිණිලිකාරියගේ හෝ ඇය පරීක්ෂා කළ වෛද්‍ය කාර්ය මණ්ඩලයේ හෝ සම්මුඛ පරීක්ෂණ නොපවත්වාම තම සොල්දාදුවන් නිදොස් කොට නිදහස් කර යවන ලද බව අලුතින්ම ප්‍රකාශයට පත් කෙරුනු ඇසෝෂියේටඩ් ප්‍රෙස් වාර්තාවක දැක්වෙයි.

“ශ්‍රී ලංකා සාම සාධක භටයන් විසින් හයිටියේදී කරන ලද බවට චෝදනා ලබන ස්ත්‍රී දූෂණ පිළිබඳ විමර්ශනය කිරීම භාරව, යුද අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලබන ජගත් ඩයස් යෙදැවීම හයිටි වින්දිතයන්ට කරන අපහාසයකි,” යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. “ජගත් ඩයස්ම විමර්ශනයට ලක් කළ යුත්තෙකි. හයිටියේ අතීතයේ සිදුවූ අපචාර සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වන කාලයක් උදා වන තුරු ශ්‍රී ලංකාවේ සාම සාධක භටයන් යොදවාගැනීම එක්සත් ජාතීන් විසින් අත් හිටුවිය යුතුය. යුද අපරාධ චූදිතයන් විසින් ස්ත්‍රී දූෂණ චූදිතයන් නිදොස් කොට නිදහස් කිරීමට එක්සත් ජාතීන් වගකිව යුතු නොවේ. සැබවින්ම, හයිටි ජනතාවට ශ්‍රී ලංකාවේ ජනතාවට මෙන්ම මීට වඩා හොඳ සැලකිල්ලක් දැක්විය යුතුව ඇත.”

සාමාන්‍ය වැසියන් හෝ සාමාන්‍ය වැසියන් සිටින ස්ථාන හෝ ඉලක්ක කර ජගත් ඩයස් ගේ 57 සේනාංකය සහභාගී වී  එල්ල කළ බවට චෝදනා ලබන ප්‍රහාර ගණනාවක්  ITJP ගොනුව විස්තර කරයි. අධිකරණයකදී  ඔප්පු කරනු ලැබුවහොත් ඒවා යුද අපරාධ ගණයට වැටෙයි.

එක්සත් ජාතීන්ගේ විමර්ශනයකට අනුව “යුද මුක්ත කලාපයේ” පිහිටි වල්ලිපුනම් තාවකාලික රෝහල 2009 ජනවාරියේදී පහළොස් වතාවක් සෘජු ප්‍රහාර වලට ගොදුරු වූ අතර ඊට අමතරව එයින් කිලෝමීටරයක වට ප්‍රමාණයක් ඇතුලත තවත් ස්ථාන පනහකට කාලතුවක්කු බෝම්බ පතිත විය. මෙය සිදුවූයේ පැහැදිලිව ලකුණු කොට තිබූ, යුද හමුදා ඩ්‍රෝන වලට දැකගත හැකිවූ රෝහල් පිහිටි ස්ථාන වල අක්ෂාංශ සහ දේශාංශ  57 සේනාංකය ඇතුළු අනිකුත් ඒකක වලට නිශ්චිතවම දැනුම් දී තිබියදීය. තුවාල ලද සාමාන්‍ය වැසියන් සිය ගණනක් ලැගුම් ගෙන සිටි එම ආරෝග්‍යශාලාවට විශාල ප්‍රදේශයක් එකවර

ගොදුරු කරගත හැකි මල්ටි බැරල් රොකට් (MBRL) සහ පොකුරු බෝම්බ යොදාගෙන ප්‍රහාර එල්ල කරනු ලැබුවේ සිදුවන සමූහ ඝාතනය ගැන දැනුවත් කමකින් යුතුවය.

"තුවාල ලද ජනතාවගෙන් පිරී ගිය රෝහල් වලට දිගින් දිගටම පහර දීම පැහැදිලිවම ම්ලේච්ඡ ක්‍රියාව කි," යි යැස්මින් සූකා පැවසුවාය. "ඊට අණ දුන් අයට එරෙහිව නඩු පැවරීම සඳහා ඉතා ප්‍රබල සාක්ෂි අප සතුව ඇතත්, අට වසරක් ගතවී තිබියදීත් කිසිම පියවරක් ගෙන නැත. එසේ නොකර, ජාත්‍යන්තර අක්‍රිය භාවය විසින් වෙනත් රාජ්‍යවලට පෙන්වා දී ඇත්තේ ශ්‍රී ලංකා යුද හමුදාවේ උපාය මාර්ගය අනුගමනය කළහොත් ඔවුන්ටද මහා පරිමාණ කෲරකම් සිදුකොට ගැලවී යා හැකි බවයි."

වඩාත් බරපතල ලෙස ප්‍රහාරයට ලක්වූ වෛද්‍ය මධ්‍යස්ථානයක් වූයේ පුදුකුඩියිරුප්පු රෝහලයි. එය ආණ්ඩුව හොඳින් දැන සිටි ස්ථානයක පිහිටා තිබුනි. 2009 ජනවාරි අගදී අඩුම වශයෙන් රෝහල් ගොඩනැගිලි 30ක් බරපතල හානියට හෝ විනාශයට පත්වූ බව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පරීක්ෂා කරන ලද චන්ද්‍රිකා ඡායාරූප වලින් පෙනී ගියේය. එමෙන්ම, තුවාල ලද සාමාන්‍ය වැසියන් සිය ගණනකින් පිරී තිබුනු පුදුකුඩියිරුප්පුවේ වෛද්‍ය පොන්නම්බලම් පුද්ගලික රෝහලට ඉහලින් 2009 පෙබරවාරි මුලදී ඩ්‍රෝන පියාසර කර මද වේලාවකින් එය සුපර්සොනික් ජෙට් යානා වලින් හෙලන ලද බෝම්බ දෙකකින් විනාශ කර දමන ලදී.

"යුද අපරාධ චෝදනා පිළිබඳ වගවීම සහතික කරනු වෙනුවට ශ්‍රී ලංකා ආණ්ඩුව කර ඇති එකම දෙය වන්නේ අපරාධ සම්බන්ධයෙන් චූදිත ජගත් ඩයස් වැන්නන්ට උසස් වීම් ලබා දීමය," යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. "ඔහු යුද හමුදා මාණ්ඩලික ප්‍රධානියා ලෙස පත් කළේ රාජපක්ෂ පාලනය නොවේ, ජනාධිපති සිරිසේනයි."

ITJP තොරතුරු ගොනුව (අ) ශ්‍රී ලංකාව සඳහා වන විශේෂ දෙමුහුන් අධිකරණය කඩිනමින් ස්ථාපිත කරන ලෙසත් (ආ) සාපරාධී ක්‍රියා සම්බන්ධ වගවීම සහතික කරනු පිණිස කරුණු තහවුරු කරගැනීම සඳහා ඊට පෙර ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් පවත්වන ලෙසත් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලා සිටියි.

නිමි

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT